**ශීර්ෂය 261 - ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගාල්ල දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) උප වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය අනුව 2017 දෙසැම්බර් 31 දිනට දේපල, පිරියත හා උපකරණ වටිනාකම රු.2,355,604,474 ක් වූ අතර ඒසීඒ – 6 ආකෘතිය අනුව 2018 ජනවාරි 01 දිනට එම වටිනාකම රු.1,984,474,798 ක් වශයෙන් දක්වා තිබුණි. ඒ අනුව දේපල, පිරියත හා උපකරණ ආරම්භක ශේෂය රු.371,129,676 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | දේපළ පිරියත හා උපකරණ ආරම්භක ශේෂයේ වෙනස හඳුනාගෙන ගිණුම් නිවැරදි කළ යුතුය. | ගිණුම්ගත නොකළ දේපල පිරියත හා උපකරණ ඉදිරි වර්ෂ දෙක තුළ ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (ආ) | බෙන්තොට හා අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල එකතුව රු.110,987,637 ක් වූ වත්කම් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිහිටා ඇති භූමියෙහි වටිනාකම රු.311,500,000 ක් මූල්‍ය ප්‍රකාශනයට ඇතුලත් කර නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා අදාළ සියළු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දේපළ පිරියත හා උපකරණ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. | මෙම දේපළ පිරියත උපකරණ වටිනාකම භාණ්ඩාගාරයට වාර්තා කර ඇති නමුත් භාණ්ඩාගාරයේ පොත්වල ඇතුළත් වී නොමැති අතර **2019** වර්ෂයේදී මෙම වෙනස ගැලපුම් කිරීම සඳහා මාරු පත්‍රයක් ඉදිරිපත්කර ඇත. |
| (ඇ) | කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2006 වර්ෂයේ සිදු වී | නොපියවූ අග්‍රිම ශේෂය කඩිනමින් පියවීමට | අදාළ පාර්ශවයන්ගෙන් |

| | | |
|---|---|---|
| තිබුණු චෙක්පත් වංචාව හේතුවෙන් එදින සිට අග්‍රිම ගිණුමේ උද්ගත වී පවතින රු.194,086 ක නොපියවූ ශේෂය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද පියවර ගෙන නොතිබුණි. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | අයකර නිරවුල් කරන තෙක් මු.රෙ.106 ප්‍රකාරව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත වාර්තාකර තදෝචිත අත්තිකාරම් ගිණුමෙන් මුදල් ලබා ගන්නා ලෙස භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් දන්වා ඇත. ඒ අනුව ඒ සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට 2018 ඔක්තෝබර් 28 දින යවන ලද විස්තරාත්මක වාර්තාව සඳහා 2019 මැයි 03 දින වන විටද අත්තිකාරම් මුදල් ලැබී නැත. |

### 1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ ආදායම් නොවන ලැබීම් ලෙස රු.6,501,047,579 ක් දක්වා තිබුණි. විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව එය රු.**6,374,670,555** ක් වී තිබුණි. ඒ අනුව රු.126,377**,024** ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට 261 ශීර්ෂයේ හා අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අදාළ ලැබීම් හා ගෙවීම් ද ඇතුළත්කර ඇත. මුදල් පොතේ මුදල් හා හරස් සටහන් යන වටිනාකම් දෙකෙහිම එකතුව පදනම් කර ගනිමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර ඇත. |
| (ආ) | ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ, මුදල් ප්‍රවාහයේ අත්තිකාරම් ගිණුම යටතේ ලැබී තිබුණු ණය වාරිකවල වටිනාකම රු.126,**377,024** ක් වී තිබුණත් එම වටිනාකම ලැබීම් වශයෙන් දක්වා නොතිබුණි. | -එම- | |

**1.6.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | රු. | | | |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| (i) මුදල් රෙගුලාසි 104(1) | 372,619 | විගණනයට ඉදිරිපත්කර තිබුණු තොරතුරු අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකකට අදාළ වාහන අනතුරු 03 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි පරිදි කටයුතුකර නොතිබුණි. | වාහන අනතුරු සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2018 පෙබරවාරි,මාර්තු, සහ අප්‍රේල් මාසයන්හීදී සිදුවූ අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(3) වාර්තාව 2019 මැයි මාසයේදී සකස් කරන ලද අතර මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව 2019 මැයි මාසයේදී පත් කරන ලද පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාව ලද විගස ඉදිරි කටයුතු කරමි. |
| **(ii)** මුදල් රෙගුලාසි 136 | 62,708,597 | ගාල්ල දිස්ත්‍රික් ලේකම්වරයාගේ නිල නිවස ඉදි කිරීමේ කර්මාන්තය සඳහා 2018 නොවැම්බර් 30 දින ගිවිසුමකට එළඹ තිබුණි. ඒ සඳහා ප්‍රතිපාදන සලසා ගැනීම පිළිබඳව | ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලබා දීමට අදාළ තොරතුරු පවත්වාගත යුතුය. | ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුළු ප්‍රතිපාදන ප්‍රමාණය ව්‍යාපෘතිය ආරම්භයේදී වෙන්කර නොගන්නා අතර 2018 වර්ෂය සඳහා රු.මිලියන 16.9 ක් වෙන්කර ඇති නිසා ඉතිරි ප්‍රතිපාදන 2019 වර්ෂයේදී වෙන්කර |

| | | | | |
|---|---|---|---|---|
| | | තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | | ගන්නා බව සඳහන් කරමි. |

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන

| | | | | |
|---|---|---|---|---|
| 5.3.1(ඇ) මාර්ගෝපදේශය | 7,513,778 | සම්මත ලංසු කැඳවීමේ ලේඛන ප්‍රසම්පාදන කමිටුව විසින් හා තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් පරීක්ෂාකර අනුමත කළ යුතුව තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරය සඳහා රැහැන් රහිත ශබ්ද විකාශන පද්ධතියේ ප්‍රසම්පාදනයේදී ලංසු කැඳවීමේ ලේඛන සම්බන්ධයෙන් යොමුගත මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මිල ගණන් කැඳවීමට අදාළ පිරිවිතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉංජිනේරුවරියගේ අධීක්ෂණය යටතේ තොරතුරු සන්නිවේදන සහකාර නිලධාරියෙකු විසින් සකස් කළ අතර, ලංසු ලියවිලි ගිණුම් අංශය විසින් සකස් කරන ලදී. දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුමැතිය යටතේ මිල ගණන් කැඳවා ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 තැන්පත් ශේෂයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාළ තැන්පතු ගිණුම් 04 ක 2019 මැයි 13 දිනට වර්ෂ 2 කට වැඩි කාලයක් ඉක්මවූ තැන්පතු ශේෂ එකතුව රු.206,118,286 ක් සම්බන්ධයෙන් | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | **2018** දෙසැම්බර් 31 දිනට වසර 2 කට වැඩි කාලයක් ඉක්මවූ තැන්පතු ශේෂයෙන් 2019 මැයි 13 දින වන විට රු.5,125,624 ක් නිරවුල් කර ඇති බවත්, තව දුරටත් |

| | |
|---|---|
| මුදල් රෙගුලාසි 570 හා 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | නිරවුල් කළ යුතු ශේෂය රු.206,118,286 ක් වේ. |

**2.2 අත්තිකාරම් ගිණුම් ශේෂ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දින වන විට නිලධාරීන් 08 දෙනෙකුගෙන් අය වීමට තිබුණු රු.947,400 ක ණය ශේෂ අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | අය විය යුතු ණය ශේෂ ඇපකරුවන්ගෙන් හෝ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයෙන් නොපමාව අය කර ගැනීමට පියවර ගත යුතුය. | විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ණය ශේෂ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයෙන්ද, වැඩ තහනම් කළ නිලධාරීන් සම්බන්ධයෙන් අධිකරණයේ පවත්නා නඩු කටයුතු අවසන් වීමෙන් පසුවද, සේවය හැරගිය නිලධාරීයාගේ ණය ශේෂය ඇපකරුවන් විසින් නොගෙවා ඇති බැවින් නීතිමය ක්‍රියා මාර්ග තුළින්ද අය කිරීමට කටයුතු කරමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලැසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ස්ථාපිත කර ඇති | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 හි අපේක්ෂිත ප්‍රතිඵල ඉටුවන ආකාරයට ක්‍රියාකාරී සැලැස්ම තවදුරටත් සංවර්ධනය කර පිළියෙල කිරීම. | ඉදිරියේදී තිරසර සංවර්ධන ඉලක්ක ඇතුළු ප්‍රාදේශීය සංවර්ධනය ඇතිකර ගැනීමට හැකි වන අයුරින්, විගණනය |

| | | |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 හි අපේක්ෂිත ප්‍රතිඵල ඉටු කෙරෙන ආකාරයට ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | | බලාපොරොත්තු වන ආකාරයට ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීමට බලාපොරොත්තු වෙමි. |

**3.2 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 මැයි මාසයේ දිවයිනට බලපෑ ගංවතුර හා නායයෑම්වලින් හානියට පත් ප්‍රදේශවල යටිතල පහසුකම් පුනරුත්ථාපන කටයුතු සඳහා ගාල්ල දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී තිබුණු ප්‍රතිපාදන යටතේ කඩවත්-සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව ව්‍යාපෘති 199 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 240 ක ප්‍රතිපාදන නිදහස් කර තිබුණි. එම ව්‍යාපෘති 199 අතරින් ඇස්තමේන්තු වටිනාකම රු. මිලියන 93 කට අදාළ ව්‍යාපෘති 92 ක වැඩ සඳහා ගිවිසුම්ගත වී මූලික අදියරෙහි නැවතී තිබුණි. තවද ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 84 කට අදාළ ව්‍යාපෘති 23 ක වැඩ සම්බන්ධයෙන් ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | ගංවතුර උවදුර පහව යාමෙන් පසුව නොපමාව ව්‍යාපෘතිවල ප්‍රසම්පාදනයන් ආරම්භ කර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. | පැවති අයහපත් කාලගුණය හේතුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිම කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති බව පවසා ක්‍රියාත්මක කිරීමේ ආයතනය විසින් එම කාර්යයෙන් ඉවත්වීම නිසාත්, දිවයිනේ පැවති අයහපත් කාලගුණික තත්ත්වයේ බලපෑම හේතුවෙන් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කළ නොහැකි විය. |

**3.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වෙනත් අමාත්‍යාංශ 32 ක්, | අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් | වියදම් කළමනාකරණය කිරීම, වවුචර් ඉදිරිපත් |

| | | | |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තු 21 ක් හා එක් කාර්යාලයක් විසින් විවිධ කාර්යයන් සඳහා එකතුව රු. මිලියන 5,831.17 ක් ප්‍රතිපාදන ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු.මිලියන 3,863.46 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 1,967.**71** ක් හෙවත් සියයට 33.74 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. | විවිධ කාර්යයන් සඳහා ප්‍රතිපාදන ලබා දී තිබේනම්, එම ප්‍රතිපාදන වර්ෂය තුළදීම උපයෝජනය කිරීමට හැකිවන පරිදි සැලැසුම් කර ක්‍රියාත්මක කළ යුතුව ඇත. | කිරීමට ප්‍රමාද වීම, අක්මුදල් නොලැබීම සහ ඉදිකිරීම් අවසන් කිරීමට නොහැකි වීම වැනි හේතූන් නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |
| (ආ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කින් එම කාර්යාලවලට අනුබද්ධව සමෘද්ධි බැංකු සංගම් 08 ක් මගින් විවිධ ණය වැඩසටහන් සඳහා ණයලාභීන් 70,181 දෙනෙකු වෙත රු.මිලියන 381.00 ක සමස්ත ණය මුදලක් ලබා දී තිබුණි. ණයලාභීන් 856 ක් වෙත ලබා දී තිබුණු ණය මුදලින් රු.මිලියන 46.58 ක් කල් පසුවූ ණය වී තිබුණි. ණයලාභීන් 335 දෙනෙකු වෙත ලබා දී තිබුණු රු.මිලියන 11.28 ක ණය බොල් ණය වශයෙන්ද හඳුනාගෙන තිබුණි. | කල් පසු වූ ණය කඩිනමින් අය කර ගැනීමට ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් කළ යුතු අතර ණය ඉල්ලුම් කර ඇති සියළුම පුද්ගලයන්ගේ සුදුසුකම් පරීක්ෂාකර ණය ලබා දීමට කටයුතු කළ යුතු විය. | කල් පසු වූ ණය සම්බන්ධයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීමේදී සාකච්ඡා කරන ලද අතර ලිපි මගින් අදාළ ණයකරුවන් දැනුවත් කර ඇත. එසේම ණය අයකර ගැනීම සඳහා පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ සහාය ලබා ගැනීමටත්, සමථ මණ්ඩලය වෙත යොමු කිරීමටත් කටයුතු කර ඇත.<br>මෙහෙයුම් උපදෙස් අනුව මාස 03 ක ණය වාරික නොගෙවූ ණය ශේෂ කල් පසු වූ ණය ලෙස සලකන අතර මාස 09 ක වාරික නොගෙවූ ණය ශේෂ බොල් ණය ලෙස සලකනු ලබයි. මෙම ණය ලාභීන් බැංකුවේ කොටස්කරුවන් වන බැවින් කල් පසු වුවද මෙම ණය ගෙවමින් පවතී. |
| (ඇ) | 2018 වර්ෂයේ දී දිස්ත්‍රික් කෘෂිකර්ම අංශය විසින් ක්‍රියාත්මක කරන ලද ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන මගින් කෘෂි යන්ත්‍රෝපකරණ බෙදා දීමේ ව්‍යාපෘතිය යටතේ ගාල්ල දිස්ත්‍රික්කයෙහි | රජයේ අරමුදල් මගින් මිලදීගෙන ඇති කෘෂි උපකරණ, සුදුසු ප්‍රතිලාභීන් තෝරාගෙන විධිමත් පරිදි බෙදා දීමට කටයුතු කළ යුතු වීම. | පිනිකහන ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ගබඩා කර ඇති යන්ත්‍ර 30 ක් මාතර දිස්ත්‍රික්කයට ලබාදීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයේ අනුමැතිය ලබා ගැනීමට |

| | | | |
|---|---|---|---|
| | ගොවීන්ට බෙදා දීම සඳහා රු.1,300,000 ක් වටිනා මෝටරය රහිත වල් නෙලන යන්ත්‍ර 60 ක් මිලදීගෙන තිබුණි. 2019 ජනවාරි 07 දින දක්වාම ඒවායින් 30 ක් ප්‍රතිලාභීන්ට බෙදා දීමට කටයුතු කර නොතිබුණි. | | කටයුතු යොදා ඇත. |
| (ඇ) | ගංවතුර ආපදා සහන සැලැසීමේ ව්‍යාපෘතිය යටතේ ගංවතුරෙන් ආපදාවට පත් පුද්ගලයින්, ආයතන හා ප්‍රදේශ නැවත යථා තත්වයට පත්කර ගැනීම සඳහා ආසියානු සංවර්ධන බැංකු මූලාධාර යටතේ 2017 වර්ෂයේදී ගාල්ල දිස්ත්‍රික්කයට රු.184,000,000 ක මූලාධාරයක් ලබා දී තිබුණි. එම මූලාධාර වියදම් සංරචකයන් 05 ක් යටතේ උපයෝජනය කිරීමට සැලැසුම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | එක් ආපදා සුරක්ෂිත මධ්‍යස්ථානයක් ඉදි කිරීමේදී පැවති අධික වර්ෂාවත් වැඩ බිමට යන මාර්ගය කොන්ක්‍රීට්කර වසා තැබීමත් හේතුවෙන් අමුද්‍රව්‍ය ප්‍රවාහනය කළ නොහැකි වීම යන හේතු නිසා ව්‍යාපෘති කාල සීමාව තුළදී සම්පූර්ණයෙන් නිම කිරීමට නොහැකි වීම නිසාත් තවත් මධ්‍යස්ථාන 04 ක ඉදි කිරීම් සඳහා සියයට 15 ක වැට් සමඟ ඇස්තමේන්තු සකස් කළත් වැට් ලියාපදිංචි නොමැති කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදි කිරීම් කළ නිසාත් රු.15,579,450 ක ප්‍රතිපාදන ඉතිරි වී ඇත. විදුලි ජනන යන්ත්‍ර මිලදී ගැනීමේ ප්‍රසම්පාදනය සඳහා රු.19,244,060 ක් වෙන් කළත් එම ප්‍රසම්පාදනය රු.18,412,320 කට ඉටු කිරීම නිසා රු.831,740 ක් ඉතිරි විය. |
| **(i)** | සංරචකයන් දෙකක් යටතේ රු.මිලියන 16.41ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. | විදේශ මූලාධාර ප්‍රතිපාදන අදාළ කාල සීමාව තුළදී සම්පූර්ණයෙන් උපයෝජනය කරගත යුතුය. | |
| **(ii)** | ඉහත ව්‍යාපෘතියට අදාළ ගිවිසුමෙහි 3 වන | ගිවිසුම් ප්‍රකාරව අදාළ කටයුතු කළ යුතුය. | නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |

| | | | |
|---|---|---|---|
| | කොන්දේසිය ප්‍රකාරව ව්‍යාපෘතිය යටතේ විදුලි ජනන යන්ත්‍ර සපයා සවිකිරීමේ ඇනවුමට අදාළ සියළු කටයුතු 2018 මාර්තු 05 දින වන විට අවසන් කළ යුතුව තිබුණි. නමුත් 2018 සැප්තැම්බර් 27 දින වන විටත් නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි විදුලි ජනන යන්ත්‍රය ස්ථාපිත කිරීමේ කටයුතු අවසන්කර නොතිබුණි.<br><br>තවද, පෞද්ගලික බැංකුවක් මගින් ඉදිරිපත් කරන ලද රු.1,823,256 ක් වූ කාර්යසාධන සුරක්ෂණයද 2018 මාර්තු 26 දිනයෙන් පසු කල් ඉකුත්වී තිබුණි. | | ගංවතුරින් යට වන බැවින් විදුලි ජනන යන්ත්‍රය උස් ස්ථානයක ස්ථාපිත කිරීමට සිදුවූ අතර එම ස්ථාපන කටයුතු මේ වන විට අවසන් කර ඇත. අතපසුවීමකින් කාර්ය සාධන සුරක්ෂණයේ කාලය දීර්ඝ කර ගැනීමට නොහැකි විය. |
| (ඉ) | තිරසර පාසල් වැඩසටහන යටතේ පාසල් තුරු උයන් ව්‍යාපෘතිය සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයෙන් රු.1,675,080 ක ප්‍රතිපාදන 2018 ජූලි 02 දින ගාල්ල දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී තිබුණි. එම ව්‍යාපෘතිය යටතේ ගාල්ල දිස්ත්‍රික්කයෙහි තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි පාසල් 142 ක සිටුවීම සඳහා පළතුරු, ඔසු පැල හා කුළු බඩු භෝග පැල 8,876 ක් බෙදා දීමට නියමිතව තිබුණි. නමුත් ව්‍යාපෘතිය සැලසුම් සහගතව, ඵලදායීව ක්‍රියාත්මක නොකිරීම නිසා ප්‍රතිපාදනයෙන් රු.1,100,049 ක් එනම් සියයට 66 ක් උපයෝජනය නොකිරීම හේතුවෙන් එම ප්‍රතිපාදන ආපසු ජනාධිපති ලේකම් කාර්යාලය වෙත පවරා තිබුණි. | ව්‍යාපෘති සඳහා ලැබෙන ප්‍රතිපාදන උපරිම වශයෙන් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතු වීම. | මෙම වැඩසටහන සඳහා අප වෙත නිදහස් කරන ලද රු.1,675,080 න් රු.600,000 ක ප්‍රතිපාදන පවරා දී ඇත. ඉතිරි ප්‍රතිපාදනයෙන් සියයට 46.5 ක් භාවිතා නොකරන ලදී. ප්‍රතිපාදන ප්‍රතිශතය කි. පැල පාසල්වලට ප්‍රවාහනය කිරීමේ කටයුත්ත තෙලිජ්ජවිල බීජ හා රෝපණ ද්‍රව්‍ය කාර්යාලය විසින් ඉටු කිරීමට එකඟ වූ බැවින් ප්‍රවාහනය සඳහා වෙන්කර තිබුණු රු.340,000 ක මුදල ඉතිරි වූ අතර බද්ධ පැල වෙනුවට බීජ අතු පැලද මිලදීගෙන ඇති බැවින් මුදල් ඉතිරි විය. පාසල් 142 කට දෙසැම්බර් නිවාඩුවට පෙර පැල ලබා දීමට අවශ්‍ය බැවින් එහි දී මතුවන ප්‍රායෝගික ගැටළු |

| | | | |
|---|---|---|---|
| | | | අවම කිරීම සඳහා යම් ප්‍රතිපාදන ප්‍රමාණයක් වැඩියෙන් ඇස්තමේන්තු කර ඇත. |
| (ඊ) | අයහපත් කාලගුණය හේතුවෙන් විපතට පත් ජනතාව නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ගාල්ල දිස්ත්‍රික්කය සඳහා 2017 වර්ෂයේදී රු.මිලියන 119.20 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශ සංග්‍රහයේ අවශ්‍යතා සම්පූර්ණ කර නොතිබුණු ප්‍රතිලාභීන් දෙදෙනෙකුට රු.1,800,000 ක් ගෙවා තිබුණි. | ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. | නිවාස ඉදිකිරීම්වල සමස්ථ තත්ත්වය සලකා බලා වාරික නිදහස්කර ඇති අතර මේ වන විට එක් ප්‍රතිලාභියෙකු ඉදිකිරීම් වැඩ අවසන් කර ඇත. අනෙක් ප්‍රතිලාභියාගේ අවසන් වාරිකය නිදහස් නොකළ අතර එහි ප්‍රගතිය සම්බන්ධයෙන් වාර්තාවක් ලබා දෙන ලෙස ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර ඇත. |
| (උ) | ඉහත (ඊ) සඳහන් ව්‍යාපෘතිය යටතේ අනුමත සැලසුමට අනුකූලව අත්තිවාරම සකස්කර නොතිබුණු එක් ප්‍රතිලාභියෙකුට රු.200,000 ක් ගෙවා තිබුණි. ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මගින් පරීක්ෂාකර ආපදා ප්‍රත්‍යස්ථ ගුණාංගවලින් තොර බවට නිර්දේශ කර තිබූ තවත් ප්‍රතිලාභීන් දෙදෙනෙකු විසින් ඉදිකර තිබූ නිවාස දෙක සඳහා පළමු වාරිකය වශයෙන් රු.200,000 ක් බැගින් ගෙවා තිබුණු අතර ඉතිරි වාරික මුදල් | නිවාස ඉදිකිරීම සඳහා ලබා දී ඇති උපදෙස් අනුව ප්‍රතිලාභීන් කටයුතු කලයුතු බව ආරම්භයේ සිටම අදාළ නිලධාරීන් විසින් අධීක්ෂණය කළ යුතු වීම. | අත්තිවාරම අදාළ ප්‍රමිතීන්ට අනුව නැවත සකස් කිරීමට උපදෙස් දී ඇති අතර එම නිවැරදි කිරීම් සිදු කර මාස 2 ක් තුළ ප්‍රගතිය වාර්තා කිරීමට ප්‍රාදේශීය ලේකම්වරයා දැනුවත් කර ඇත. අනෙක් ප්‍රතිලාභීන් දෙදෙනා සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති තාක්ෂණ වාර්තාව අනුව ගෙවීම් කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා ජාතික |

| | | | |
|---|---|---|---|
| | ගෙවීම අත්හිටුවා තිබුණි. මේ සම්බන්ධව 2019 ජනවාරි 07 දින තාක්ෂණික කමිටුවක් පත්කර තිබුණු නමුත් 2019 පෙබරවාරි 22 දින දක්වා එම කමිටුව විසින් කිසිදු නිර්දේශයක් ලබා දී නොතිබුණි. | | ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙත යවා ඇත. |
| (ඌ) | 2018 ඔක්තෝබර් 26 දින මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් ලැප්ටොප් පරිගණක 06 ක් වැලිවිටිය-දිවිතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබා දී තිබුණද, **Intergrade Treasury Information System** වැඩසටහන ක්‍රියාත්මකව නොමැති බැවින්, 2019 පෙබරවාරි 15 දින වන විටත් එම පරිගණක භාවිතයෙන් තොරව ගබඩාව තුළ රඳවාගෙන තිබුණි. | අදාළ වැඩසටහන කඩිනමින් ක්‍රියාත්මක කර පරිගණක ප්‍රයෝජනයට ගැනීමට හෝ වැඩ සටහන් ක්‍රියාත්මක කළ නොහැකි නම් එම පරිගණක ආපසු භාරදීමට කටයුතු කළ යුතුය. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ **Intergrade Treasury Imformation System** වැඩසටහන ක්‍රියාත්මකව නොමැති බැවින් සහ එම පරිගණක වෙනත් වැඩසටහනකට යොදා ගත නොහැකි බැවින් අදාළ ලැප්ටොප් පරිගණක ගබඩාවෙහි රඳවාගෙන ඇත. |
| (එ) | ගම්පෙරළිය වැඩසටහන 2018 යටතේ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය මගින් බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සැලැසුම් කළ ව්‍යාපෘති 216 ක් ක්‍රියාත්මක කිරීම සඳහා 2018 සැප්තැම්බර් 18 දින රු.මිලියන 95 ක් ගාල්ල දිස්ත්‍රික් ලේකම් වෙත වෙන්කර දී තිබුණි. 2018 දෙසැම්බර් 12 දින වන විට මෙම සැලැසුම් කරන ලද ව්‍යාපෘති වලින් රු.1,940,000 ක් වටිනා ව්‍යාපෘති 2ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණු අතර ව්‍යාපෘති 214 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | කඩිනමින් ව්‍යාපෘති වැඩ ආරම්භකර ව්‍යාපෘතියේ කාර්යභාරය කොන්ත්‍රාත්කරුවන් මගින් ඉටු කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | 2018 නොවැම්බර් මාසයේදී සිදුවූ දේශපාලන පෙරළිය හේතුවෙන් ගම්පෙරළිය වැඩසටහන යටතේ මූලික වැඩ කිසිවක් ආරම්භ කර නොමැති ව්‍යාපෘති ආරම්භ කිරීම රජය අත්හිටවූ බැවින් ව්‍යාපෘති ආරම්භ කිරීමට නොහැකි විය. |
| (ඒ) | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කරන | ව්‍යාපෘති ඉටු කිරීම සඳහා කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹීමෙන් පසු ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘතිය නිම | දේශපාලන අස්ථාවර භාවයක් නිසා මුදල් ලබාගත නොහැකි වේ යැයි යන කරුණ මත |

| | | | |
|---|---|---|---|
| | ලද ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ විශේෂ වැඩසටහන (II අදියර) මගින් බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ව්‍යාපෘති 23 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 27.2 ක ප්‍රතිපාදන අනුමත කර තිබුණි. එම ප්‍රතිපාදන වලින් ව්‍යාපෘති 06 ක් සඳහා 2018 ඔක්තෝබර් 19 හා 26 දිනවල රු.මිලියන 3.00 ක් ප්‍රතිපාදන ලැබී තිබුණි. ඉන් ව්‍යාපෘති 04 ක් ඉටුකිරීම සඳහා සමිති 04 ක් සමග ගිවිසුම්වලට එළඹ තිබුණද, 2018 දෙසැම්බර් 11 දින වන විටත් එම වැඩ ආරම්භ කර නොතිබුණි. | කර ගැනීමට කටයුතු කළ යුතුය. | ගිවිසුම්ගත වූ ව්‍යාපෘති 04 ආරම්භ නොකළ බවට ලිපි ලැබී ඇත. 2018 නොවැම්බර් 19 දින වන විටත් වැඩ ආරම්භ කර නොමැති ව්‍යාපෘති ක්‍රියාත්මක නොකර නතර කිරීමට උපදෙස් දීම මත අනෙක් ව්‍යාපෘති 19 ද ක්‍රියාක්මක කළ නොහැකි විය. |
| (ඔ) | ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ක්‍රියාත්මක කරන ලද නිල සෙවන ඉදි කිරීම් ව්‍යාපෘති වෙනුවෙන් එක් ගොඩනැගිල්ලකට රු.මිලියන 2 බැගින් ගොඩනැගිලි 16 ක් ඉදි කිරීම සඳහා රු.මිලියන 32 ක ප්‍රතිපාදන බද්දේගම ප්‍රාදේශීය ලේකම් වෙත 2017 වර්ෂයේදී ලබා දී තිබුණි. නිල සෙවන ගොඩනැගිලි 09 ක් ඉදි කිරීම සඳහා වෙනත් රජයේ ආයතනවලට අයත් ඉඩම් භාවිතා කර තිබූ නමුත් ඉදිකිරීම්වලට පෙර එම ආයතනවල එකඟතාවය ලබාගෙන නොතිබුණි. ඉදිකිරීම් සඳහා තෝරාගෙන තිබුණ තවත් ඉඩමක අනවසර පදිංචිකරුවකු තාවකාලික නිවසක් ඉදිකරගෙන සිටින බැවින් අත්තිවාරම් මට්ටම දක්වා ඉදිකරන ලද නිල සෙවන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අත්හැර තිබුණි. | ඉඩම්වල අයිතිය නිරවුල් කර ගැනීමෙන් සහ පවරා ගැනීමෙන් පසුව ඉදිකිරීම් ආරම්භ කළ යුතුව තිබුණි. | ඉදිකිරීම් කටයුතු සඳහා පැවති ඉඩම් හිඟතාවය නිසා දැනට වසා දමා ප්‍රාදේශීය ලේකම් වෙත අයිතිය පවරා ඇති පාසල් ඉඩම්වල මෙම ඉදි කිරීම් කර ඇති අතර අදාළ ඉඩම් කොටස් විධිමත්ව පවරා ගැනීම සඳහා නිදහස් කර දෙන ලෙස අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කර ඇත. අනෙක් ඉඩමේ අනවසර පදිංචිකරු වෙනත් ස්ථානයක පදිංචි කරවීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. ඉන් පසුව නිල සෙවන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ආරම්භ කිරීමට අපේක්ෂා කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඕ) | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ එක් ව්‍යාපෘතියක් සඳහා රු.මිලියන 2 ක් බැගින්, නිල සෙවන ව්‍යාපෘති 17 ක් වෙනුවෙන් 2017 වර්ෂයේදී රු.4,776,000 ක ප්‍රතිපාදන සළසා තිබුණි. 2018 සැප්තැම්බර් 05 දින වන විට ව්‍යාපෘති 12 ක වැඩ ආරම්භ කර තිබුණද, මාඉටිපේ, වැලිවත්ත, සංඝමිත්තපුර, කලුවැල්ල සහ දංගෙදර නිල සෙවන ව්‍යාපෘතිවල ඉදි කිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි. | අදාළ ගැටළු නිරවුල් කරගෙන කඩිනමින් ව්‍යාපෘති ආරම්භකර ජනතාවට මහජන සේවා ලබා දිය යුතුය. | ගාල්ල මහ නගර සභාවේ අනුමැතිය නොලැබීම, මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස්මත ව්‍යාපෘති ආරම්භ නොකිරීම, තෝරාගත් බිම් කොටස් ප්‍රමාණවත් නොවීම වැනි කරුණු නිසා නිල සෙවන ව්‍යාපෘති 05 ක වැඩ ආරම්භ කිරීමට නොහැකි විය. |
| (ක) | 2017 වර්ෂයේ ගංවතුරින් හානියට පත්වූ යටිතල පහසුකම් යථා තත්ත්වයට පත් කිරීමේ වැඩසටහන යටතේ දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග පිළිසකර කිරීම පිළිබඳ ව්‍යාපෘතිය යටතේ වැඩ ආරම්භ කර තිබුණු නමුත් 2018 සැප්තැම්බර් 13 දින වන විට ගිවිසුම් කාලය ඉකුත්වී මාස 09 කට ආසන්න කාලයක් ගතවී තිබුණු සහ භෞතික ප්‍රගතිය සියයට 50 ක මට්ටමට ළඟාවී නොමැති එකතු වටිනාකම රු.මිලියන 14.22 ක් වූ මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘති 04 ක වැඩ අතරමග අතහැර දමා තිබුණි. | ව්‍යාපෘති අවශ්‍යතාවයන් අනුව ප්‍රමුඛතා පිළිවෙලකට හඳුනාගෙන ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබාගෙන ව්‍යාපෘති ඉටු කිරීමට කටයුතු කිරීම. | කොන්ත්‍රාත්කරුවන්ට වෙනත් කර්මාන්තවලට ගෙවීමට නියමිතව තිබුණු මුදල් නොගෙවීම හේතුවෙන් ව්‍යාපෘති අතරමග නතර කළ බවත්, මුදල් ලැබුණු පසු ව්‍යාපෘති වැඩ ආරම්භ කරන බවත් දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් ඉංජිනේරු විසින් මා වෙත දන්වා ඇත. |
| (ග) | විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2017 මැයි මාසයේදී ඇතිවූ ගංවතුරින් හානියට පත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම යටතේ සැලසුම්කර තිබුණු ඇස්තමේන්තුගත පිරිවැය | කඩිනමින් ව්‍යාපෘති වැඩ අවසන් කිරීමට පියවර ගැනීම. | එක් මාර්ගයක් අයත් ආයතනයේ අනුමැතිය නොලැබීම හේතුවෙන් ව්‍යාපෘතිය ඉටු කිරීම ගැටළු සහගත වීම සහ අනෙක් මාර්ග දෙක සඳහා මුදල් ලැබීම ප්‍රමාද |

| | | | |
|---|---|---|---|
| | රු.මිලියන 7.79 ක් වූ මාර්ග 03 ක වැඩ 2017 දෙසැම්බර් 31 දින වන විට නිම කළ යුතුව තිබුණ ද, 2019 මැයි 15 දින දක්වාම එම ව්‍යාපෘති සම්පූර්ණකර නොතිබුණි. 2019 මැයි 15 දින වන විට එක් ව්‍යාපෘතියක් සඳහා රු.10,709 ක් ගෙවා තිබුණි. | | වීම හේතුවෙන් හා අවිච්ඡේද අනුමත වන්නේද යන්නට නිසි පිළිතුරක් නොලැබීම හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. |
| (ච) | විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගම්පෙරලිය වැඩසටහන යටතේ සැලැසුම්කර තිබුණු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 83.33 ක් වූ සංවර්ධන ව්‍යාපෘති 99 ක් හා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම් යටතේ සැලසුම්කර තිබුණු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලින 1.47 ක් වූ සංවර්ධන ව්‍යාපෘති 03 ක් රේඛීය අමාත්‍යාංශ විසින් ලබාදී තිබුණු උපදෙස්මත ක්‍රියාත්මක නොකර අත්හැර තිබුණි | සලසා දී තිබුණු ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුව ඇත. | 2018 ඔක්තෝබර් 26 දින අමාත්‍යාංශ වෙනස්වීම හේතුවෙන් අදාළ රේඛීය අමාත්‍යාංශයෙන් ලබා දුන් උපදෙස් අනුව ඒ වන විට ආරම්භ නොකළ ව්‍යාපෘති වැඩ අත්හිටුවීමට සිදුවිය. |

## 3.4 ප්‍රසම්පාදනයන්

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. 2018 වර්ෂය සඳහා සංශෝධිත | විධිමත් පරිදි ප්‍රසම්පාදන සැලැසුම පිළියෙල කර දිස්ත්‍රික් ලේකම් වෙත ඉදිරිපත්කර අනුමැතිය ලබාගත යුතු අතර, නියමිත දිනට ප්‍රසම්පාදන කමිටු හා | ප්‍රසම්පාදන සැලසුම සියළු විස්තර ඇතුළත් වන සේ පිළියෙල කිරීමට ප්‍රාදේශීය ලේකම්ට උපදෙස් ලබා දී ඇත. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රසම්පාදන සැලැස්ම 2018 අප්‍රේල් මාසයේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පිළියෙල කර දිස්ත්‍රික් ලේකම් වෙත ඉදිරිපත් කර තිබුණද, විගණන දිනය වූ 2018 ජූලි 13 දින වන විටත් දිස්ත්‍රික් ලේකම් විසින් එය අනුමත කර නොතිබුණි. | තාක්ෂණික ඇගයීම් කමිටු පත්කර ලංසු ලේඛන සකස් කිරීමට උපදෙස් හා මගපෙන්වීම් කිරීම. | |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙහි 7 වන මහලෙහි ශ්‍රවණාගාරය සඳහා රැහැන් රහිත ශබ්ද විකාශන පද්ධතියක් මිලදී ගැනීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත 2018 ඔක්තෝබර් 29 දින රු.මිලියන7.51 ක් ගෙවා තිබුණි. 2018 වර්ෂයේ ප්‍රසම්පාදන සැලසුමට අනුව උක්ත ශබ්ද විකාශන පද්ධතිය මිලදී ගැනීමේ කටයුතු 2018 සැප්තැම්බර් 30 දින අවසන් කළ යුතු වුවත්, මාසයකට ආසන්න ප්‍රමාදවීමකින් පසුව 2018 ඔක්තෝබර් 29 දින මෙම ප්‍රසම්පාදන කටයුතු අවසන් කර තිබුණි. තවද ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 6.6 ක් ලෙස ප්‍රසම්පාදන සැලැස්මෙහි සඳහන් කර තිබුණද, සත්‍ය වියදම රු.මිලියන 7.5 ක් වූයෙන් රු. මිලියන 0.9 ක සැලසුම්ගත පිරිවැය ඉක්මවා තිබුණි. | පිරිවැය ඇස්තමේන්තු නිවැරදිව පුරෝකථනය කිරීමටත් නියමිත කාලය තුළ සංශෝධනයන් සිදුකර අනුමැතිය ලබා ගැනීම කෙරෙහිත් අවධානය යොමු කිරීම. | අදාළ ප්‍රසම්පාදන කාර්යය සඳහා මාසයක පමණ ප්‍රමාදයක් සිදුවූ බව පිළිගන්නා අතර කාලය හා පිරිවැය සංශෝධනය කර සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර ඇත. |
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කරන්නේ නම් ප්‍රසම්පාදන කමිටු සාමාජිකයන්ට හා ඊට සම්බන්ධවන නිලධාරීන්ට කිසිදු දීමනාවක් ගෙවිය නොහැකි වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කරමින් ඉටු කර තිබුණු ප්‍රසම්පාදන කාර්යයන් දෙකක් වෙනුවෙන් කමිටු සාමාජිකයන්ට එකතුව රු.58,000 ක් ගෙවා තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4(ඉ) මාර්ගෝපදේශය පරිදි කටයුතු කිරීම. | අදාළ ප්‍රසම්පාදන කාර්යය සීමිත මිල ගණන් කැඳවීම යටතේ සිදුකර ඇත. |

**3.5 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම**

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන විමසුම පිළිබඳ විස්තරය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ------------------------------------ | ----------- | ----------------------------- |
| 2019 අප්‍රේල් 02 දින දක්වා නිකුත් කරන ලද, 2018 වර්ෂයට අදාළ විගණන විමසුම් 08 කට 2019 මැයි 15 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | විගණන විමසුමේ දක්වා ඇති පරිදි නියමිත දිනට පෙර පිළිතුරු ඉදිරිපත් කළ කිරීම. | 2019 මැයි 31 දින දක්වා පිළිතුරු ඉදිරිපත්කර නොතිබුණි. |

**3.6 කළමනාකරණ දූර්වලතා**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| ----------------------- | | ----------- | ---------------------------- |
| (අ) | ගම් පුළුල් කිරීමේ වැඩසටහන යටතේ නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පුද්ගලයන් පදිංචි කිරීම සඳහා අක්කර 467 ක් වූ ඇප්තොප්වත්ත නැමති ඉඩම රජයට පවරා ගැනීමේ කටයුතු 1999 වර්ෂයේදී ආරම්භකර තිබුණද, 2018 ජූලි 13 දින වන විටත් එම ඉඩම් පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි. තවද මහජනතාව පදිංචි කරවීම සඳහා මෙම ඉඩම් අත්පත් කර ගැනීමට සැලසුම් කර තිබුණද, ඒ තුළ පදිංචියට නුසුදුසු තත්ත්වයේ ඉඩම් පැවතීම, අත්කර ගන්නා ඉඩම් අදාළ අරමුණ සඳහා යොදා ගන්නා තෙක් එම ඉඩම් අනවසර පදිංචිකරුවන්ගෙන් ආරක්ෂා කර ගැනීමට නොහැකි වීම, බෙදාදුන් ඉඩම් හිමිකම් නොකී වෙනත් බාහිර පාර්ශවයන්ට පවරා තිබීම, අදාළ ඉඩමෙහි පැවති විශාල කැලෑ අනවසරකරුවන් විසින් හෙලි පෙහෙළි කිරීම හා එමගින් විශාල පරිසර හානියක් සිදුකර තිබුණි. | මතුවී ඇති ගැටළු කඩිනමින් නිරවුල් කර මෙම ඉඩම ගම් පුළුල් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගැනීම. | 1999 වර්ෂයේ ඉඩම් අත්කරගැනීම් කටයුතු ආරම්භකර ඇති අතර, අනවසරකරුවන් 40 දෙනෙකුගේ සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යටතේ නඩු පවරා ඇත. ගස් කැපීමේ කටයුතු සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලිකර නඩු පැවරීමට කටයුතු කර ඇති අතර ඉඩමේ හිමිකාරීත්වය සම්බන්ධ නඩු විභාගයට අදාළ තීන්දුව මෙතෙක් ලබා දී නොමැත. |
| (ආ) | කාර්යාලය සතු මෝටර් රථයක් 2014 | 1998 නොවැම්බර් 27 | මෙම රථය පාසැලකට |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයේ සිට ධාවනයෙන් ඉවත් කර අපහරණය කිරීමට නිර්දේශකර තිබුණද එම කටයුතු 2019 මැයි 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. | දිනැති අංක මුදල් 353 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | පැවරීමේ කටයුතු සඳහා ලිපි යොමුකර ඇති බවත් ඒ සඳහා පිළිතුරක් නොලදහොත් වෙන්දේසි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) **(i)** | ගාල්ල දිස්ත්‍රික් ලේකම් නිල නිවස ඉදි කිරීමේ කර්මාන්තය ගොඩනැගිලි ඉදි කිරීමට අදාළ කොන්ත්‍රාත්තුවක් වූ අතර ඒ සඳහා ලංසු කැඳවීමේදී ලංසුකරුවන්ට ගොඩනැගිලි ඉදි කිරීමේ **C4** සහිතව මාර්ග ඉදිකිරීම් සම්බන්ධ **C4** සුදුසුකම්ද තිබිය යුතු බව දන්වා තිබුණි. මේ හේතුවෙන් තරඟකාරී ගොඩනැගිලි ඉදිකිරීමට අදාළ ඉහළ සුදුසුකම් සහිත ලංසුකරුවන් ඉදිරිපත්වීම වළකා තිබුණි. මේ සම්බන්ධව තාක්ෂණික ඇගයීම් කමිටුව හෝ ප්‍රසම්පාදන කමිටුව අවධානය යොමුකර නොතිබුණි. එම නිසා ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා ඉහළ මිල ගණන්වලට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට සිදුවී තිබුණි. තවද තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය නොසලකා ප්‍රසම්පාදන කමිටුව කටයුතු කිරීම නිසා රු.3,256,251 ක පාඩුවක් රජයට සිදු වී තිබුණි. | ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා **C4** සුදුසුකම පමණක් නිශ්චිත අවශ්‍යතාවක් වශයෙන් සලකා බලා කටයුතු කළ යුතුවීම. | තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය පරිදි සාරානුකූල ප්‍රතිචාරාත්මක ලංසුකරු වෙතින් ඉංජිනේරු ඇස්තමේන්තු අගයට කර්මාන්තය ඉටු කිරීමේ හැකියාව සම්බන්ධයෙන් විමසා සිටි අතර ඔහු විසින් ඒ වන විට රටෙහි පැවති භාණ්ඩ මිල ඉහළ යාමේ ප්‍රවණතාවය, මිල වැඩිවීම් සඳහා ගෙවීමේ ක්‍රමවේදයක් ප්‍රසම්පාදන ලියවිලිවල ඇතුළත් නොවීම යන කරුණු හේතුවෙන් ඇස්තමේන්තු අගයට කර්මාන්තය කළ නොහැකි බව දන්වා තිබුණි. |
| **(ii)** | ඉහත කර්මාන්තය සඳහා අවම ලංසු ඉදිරිපත්කර තිබුණු සුදුසුකම් සහිත ලංසුකරු තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව විසින් ප්‍රතික්ෂේප කර තිබීම නිසා ඉහත කොන්ත්‍රාත්තුව පිරිනැමීමේදී රු.5,548,414 ක රජයට ලැබිය හැකිව තිබුණු වාසිසහගත තත්ත්වය අහිමි වී තිබුණි. | -එම- | අවම මිල ගණන් ඉදිරිපත්කර තිබුණු ටෙන්ඩර්කරුගේ පසුගිය වසර 05 ක කාලය තුළ සමාන වැඩ ඉටු කිරීම සම්බන්ධයෙන් සෑහීමකට පත්විය නොහැකි වූ බැවින් කොන්ත්‍රාත්තුව ප්‍රදානය නොකරන ලෙස තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර තිබුණි. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ප්‍රකාරව ළඟා කරගත යුතු අරමුණු සහ ඉලක්ක කරා ළඟා වීමේ සූදානම පිළිබඳ පරීක්ෂා කිරීමේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 හි ඇතුළත් සංවර්ධන අරමුණු හා ඉලක්ක 2018 වර්ෂය තුළදීද නිසි පරිදි හඳුනාගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ඇතුළත් අරමුණු හා ඉලක්ක හඳුනාගෙන එකී අරමුණු කරා ළඟා වීමට සැලැසුම් සකස්කර ක්‍රියාත්මක කිරීම. | තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳව පුහුණු වැඩමුළුවක් සංවිධානය කළ බවත් එම පුහුණුවද අදාළ කරගෙන 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස්කර ඇත. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන වන විට 3,181 ක් වූ අනුමත කාර්ය මණ්ඩලයෙන් පුරප්පාඩු 172 ක් පැවැති අතර එම පුරප්පාඩු විධිමත් පරිදි පිරවීමට කටයුතු කර නොතිබුණි. ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු 105 කින් 20 ක් ද, තෘතීයික මට්ටමේ අනුමත තනතුරු 44 කින් 18 ක් ද, ද්විතීයික මට්ටමේ අනුමත තනතුරු 2,848 කින් 132 ක් ද, පුරප්පාඩුව පැවතුණි. ඒ තුළ ද්විතියික මට්ටමේ තනතුරු 39 ක අතිරික්තයක්ද පැවතුණි. තවද විධිමත් අනුමැතියකින් තොරව අනුමත සංඛ්‍යාව ඉක්මවා නිලධාරීන් 42 දෙනෙකු අනුයුක්ත කර තිබුණි. | අනුමත කාර්ය මණ්ඩල පුරප්පාඩු පුරවාගෙන මහජන සේවාවන් කාර්යක්ෂමව ඉටුකළ යුතු අතර අනුමැතිය ලැබී නොමැති කාර්ය මණ්ඩලය හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබාගෙන කාර්ය මණ්ඩලයට ඇතුළත් කර ගැනීමට කටයුතු කළ යුතුය. | පුරප්පාඩු කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් අමාත්‍යාංශය වෙත මාසිකව තොරතුරු ඉදිරිපත් කර ඇති අතර, පත්වීම් බලධාරීන් අනුමත සීමාව ඉක්මවා අනුමත කිරීම මත අතිරික්තයක් සිදුවී ඇත. |